IHP
INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 මාර්තු 8
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# අරගලය සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි මහජනතාව අතර පුළුල් ලෙස පැතුරුණු මෙන්ම වැඩිවෙමින් පවතින සහයෝගයක් දක්නට ඇති නමුත් ශ්‍රී ලාංකිකයන් ධනවාදය කෙරෙහි අයහපත් ආකල්පයක් දරයි

2022 ඔක්තෝම්බර් මස සිට 2023 පෙබරවාරි මාසය දක්වා SLOTS මත විමසීමට අනුව ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ජනාධිපති ධුරය බිඳවැටීමෙන් මාස හයකට පසුව වුවද අරගලය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මහජන සහයෝගය ඉහළ මට්ටමක පවතින අතර එය තවදුරටත් වැඩි වෙමින් පවතී. ශ්‍රී ලාංකිකයන් දස දෙනෙකුගෙන් හය දෙනෙක්ම (55%) අරගලය පිළිබඳව හිතකර දැක්මක් පෙන්වා තිබූ අතර ශ්‍රී ලාංකිකයන් පස් දෙනෙකුගෙන් එක් අයෙක් (18%) පමණක් එය කෙරෙහි සෘණාත්මක මතයක් දරනු ලබයි. තවද, 2022 අග භාගයේ සිට 2023 මුල් කාල පරාසය දක්වා, අරගලයේ ශුද්ධ හිතකරත්වය +26 සිට +42 දක්වා ලකුණු 16 කින් වැඩි විය.

බොහෝ ශ්‍රී ලාංකිකයන්ට ප්‍රජාතන්ත්‍රවාදය (+20) සහ සමාජවාදය (+32) පිළිබඳ හිතකර අදහසක් ඇත, 2022 අග භාගයේ සිට 2023 මුල් කාල පරාසය දක්වා මෙම සංරචකයන් දෙකෙහිම ශුද්ධ හිතකරත්වය ලකුණු 14 බැගින් වැඩි වී ඇත. ඊට ප්‍රතිවිරුද්ධව, ශ්‍රී ලාංකිකයන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුට (22%) පමණක් ධනවාදය පිළිබඳ හිතකර දැක්මක් ඇති අතර, ශුද්ධ හිතකරත්වය එම කාලසීමාව තුළ සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

## බොහෝ ශ්‍රී ලාංකිකයන් අරගලය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය පිළිබඳව හිතකර අදහස් දරණ නමුත් ධනවාදය පිළිබඳ සෘණාත්මක අදහස් දරයි.




සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත සමීක්ෂණය විමසුම (SLOTS)
2022 ඔක්. 4 සිට 2023 පෙබ. 24 දක්වා වැඩිහිටියන් 2,652 දෙනෙකුගෙන් සිදුකරන ලද සමීක්ෂණය ඇසුරෙනි. ප්‍රශ්නවල සාමාන්‍යයෙන් 4-6% ක් වූ අදාළ අයිතමය ගැන මීට පෙර අසා නොතිබූ සහ එයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ ප්‍රතිචාර දක්වන්නන් බැහැර කර ඇත. සියලුම ඇස්තමේන්තු ජාතික ජනගහනයට ගැලපෙන පරිදි බර කර ඇත.

---

SLOTS මත විමසීමට අනුව, අරගලය කෙරෙහි වඩාත්ම උද්යෝගිමත් ලෙස සහය දක්වන්නනේ තරුණයන් බව මහජන අදහස් මඟින් සනාථ කරන අතරම, තාරුණ්‍යයේ (අවුරුදු 18-29) ශුද්ධ හිතකරත්වය ඉහළම අගයක (62%) තිබෙන අතර, වයස සමඟ ඒ සඳහා වන හිතකරත්වය ක්‍රමයෙන් අඩු වුවද, සෑම වයස් කාණ්ඩයක් සඳහාම ශුද්ධ හිතකරත්වය ධනාත්මක අගයක පවතියි. ධනවාදය කෙරෙහි වැඩිහිටි ශ්‍රී ලාංකිකයන්ට (-17%) වඩා (ශුද්ධ හිතකරත්වය -44%) තරුණයින්ට බොහෝ සෘණාත්මක අදහසක් ඇත.

ඊට ප්‍රතිවිරුද්ධ ලෙස, අරගලය කෙරෙහි විවිධ ජනවාර්ගික කණ්ඩායම් අතර මෙන්ම විවිධ පළාත් අතර ද දක්වනු ලබන සහයෝගය සමාන වේ, SLOTS මත විමසීමෙන් පෙන්නුම් කරන්නේ පුළුල් ලෙස පැතිරී ඇති සහයෝගයක් අරගලය කෙරෙහි ඇති අතර එය සිංහල ප්‍රජාවට හෝ බස්නාහිර පළාතට හෝ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවට පමණක් සීමා නොවන බවයි.

පුදුමයට කරුණක් නම්, වඩා උගත් සහ වඩා ධනවත් ශ්‍රී ලාංකිකයන් අතර අරගලය කෙරෙහි වඩා හිතකර මතයක් ඇති අතර ධනවාදය පිළිබඳ වඩාත් සෘණාත්මක අදහස් ඇත. විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ඇති ශ්‍රී ලාංකිකයන් අතර ධනවාදය කෙරෙහි -42%ක සෘණාත්මක ප්‍රසාදයක් ඇත.

SLOTS විමර්ශකයෙකු වන මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා අදහස් දක්වමින්, දුප්පතුන්ට පමණක් නොව, මෙතෙක් කිසිදු බලපෑමකට ලක් නොවී සිටි සමාජ හා ආර්ථික පසුබිම්වලින් යුක්ත වූ කණ්ඩායම්වලට ද වත්මන් ආර්ථික අර්බුදයේ පෙර නොවූ විරූ ස්වභාවය, බලපා ඇති බව මෙයින් පිළිබිඹු කළ හැකි බව පැවසීය. පසුගිය දශක තුන තුළ ආධිපත්‍යය දැරූ ආර්ථික ප්‍රතිපත්ති රාමුව, “ධනවාදීත්වය” බව බොහෝ ශ්‍රී ලාංකිකයන් ද වටහාගෙන තිබූ අතර, එබැවින් "ධනවාදය" කෙරෙහි තිබෙන සෘණාත්මක අදහස් සහ "සමාජවාදය" කෙරෙහි තිබෙන ධනාත්මක අදහස් මඟින් මෙම ප්‍රමුඛ ප්‍රතිපත්ති රාමුව මූලික වශයෙන් අසාර්ථක වී ඇති බවට මහජන අදහස් වලින් ගම්‍ය වේ.

අරගලය පිළිබඳ මතවල ඇති ප්‍රධාන වෙනස්කම් බොහෝ දුරට දේශපාලන වශයෙන් පක්ෂග්‍රාහී බවක් පෙන්වයි. එයට පුලුල් ලෙස පැතුරුණු සහයෝගයක් තිබියදීත්, අරගලය සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සඳහා දැක්වූ ශුද්ධ හිතකරත්වය -33% ක අගයක් තිබෙන අතර, එක්සත් ජාතික පක්ෂය සඳහා ශුද්ධ හිතකරත්වය 11% ක මධ්‍යස්ථ අගයක් දරනු ලබයි.

**සම්පූර්ණ වාර්තා ihp.lk වෙතින් ලබා ගත හැකිය.**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, “අරගලය සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි මහජනතාව අතර පුළුල් ලෙස පැතුරුණු මෙන්ම වැඩිවෙමින් පවතින සහයෝගයක් දක්නට ඇති නමුත් ශ්‍රී ලාංකිකයන් ධනවාදය කෙරෙහි අයහපත් ආකල්පයක් දරයි”, SLOTS වාර්තාව #2023-04. http://ihp.lk/publications/docs/SLOTSReport202304.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

මෙහි වාර්තා කර ඇති ප්‍රතිඵල 2022/10/04–2023/03/01 දක්වා කාලය තුළ වැඩිහිටියන් 2,720 දෙනෙකු සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා මත පදනම් වේ. සමස්ත හිතකාමී ඇස්තමේන්තු ± 4-5% ක දෝෂ ආන්තිකයක් (95% විශ්වාසනීය මට්ටම) සමඟ අනුබද්ධ වේ.

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි.

ප්‍රතිචාර දක්වන්නන්, ඔවුන් තෝරාගන්නා ලද භාෂාවෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ: සිංහල, දෙමළ, හෝ ඉංග්‍රීසි. හිතකරත්වය පිළිබඳ අසනු ලබන ප්‍රශ්නය පහත පරිදි වේ: "_______ ගැන ඔබට හිතකර හෝ අහිතකර දැක්මක් තිබේද යන්න හෝ ඔබට ඒ ගැන සැකයක් ඇත්ද, නැතහොත් ඒ ගැන ඔබ අසා නැති ද යන්න මට කියන්න පුළුවන්ද?"

ශුද්ධ හිතකරත්වය යනු හිතකර හෝ අහිතකර මතයක් ඇතැයි පැවසූ ප්‍රතිචාර දක්වන්නන්ගේ ප්‍රතිශතයේ සාමාන්‍යය යි.

SLOTS විසින් තක්සේරු කරන ලද හිතකරත්වය මඟින් මිනිසුන්ගේ අවබෝධය සලකා බලන අතර අරගලය, ප්‍රජාතන්ත්‍රවාදය, ධනවාදය සහ සමාජවාදය යන යෙදුම්වලින් ප්‍රතිචාර දක්වන්නන් තේරුම් ගන්නේ කුමක්දැයි අපට නොදක්වයි.

වාර්තා කර ඇති සියලුම ප්‍රතිඵල වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, ආගම, ගෘහ ආදායම, අධ්‍යාපනය සහ පළාත අනුව සියලුම ශ්‍රී ලාංකික වැඩිහිටියන් නියෝජනය වන ලෙස බර කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.